මුතුමුදලිගේ නිශ්ශංකගෙන්
තවත් සිනමාමය නිර්මාණයක්

තුන්වන මුද්‍රණය : 2023 සැප්තැම්බර්

ISBN 978-624-5552-12-2
එක දවසක් රෑ

2023 @ මුතුමුදලිගේ නිශ්ශංක

මුද්‍රණය -
එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො 27/18 ජයන්ත වීරසේකර මාවත
කොළඹ 10

සෝදුපත් පරීක්ෂාව - අශ්විණි ජයවර්ධන
කවර නිර්මාණය - කලණ ගංගානාත්
පරිඝනක පිටු සැකසුම - කාවින්ද්‍යා රත්නායක
ප්‍රකාශනය - පොත්මී ප්‍රකාශන

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ -බුක්, පිඩීඑෆ් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2023

'රෝස නගරය' නමින් හඳුන්වන, චමත්කාරජනක නගරයක් වෙත මම ඔබව රැගෙන යමි. මේ නගරය දැකුම්කළු, දකින්නන්ගේ මනසට අහ්ලාදයක් ඇති කරවනසුලු නගරයකි. මේ නගර මධ්‍යයේ ඇවිදින ඔබට පැහැදිලි, ක්‍රමවත් ආකෘතියකට අනුව ඉදිකර ඇති ගොඩනැගිලි පේළි දකින්නට ලැබෙනු ඇත. මේ ගොඩනැගිලි ඉදිකර ඇත්තේ රෝස පැහැ ගැන්වූ විශේෂිත ගඩොල් වර්ගයකිනි. ඒවා නගරය රෝස පැහැයෙන් අලංකෘත කරන නිසාම අතීතයේ සිටම මෙම අපූරු නගරය 'රෝස නගරය' ලෙස හැඳින්විනි.

මේ නගර මධ්‍යයේ 'අලෙක් මනුක්‍යාන්' නමින් හඳුන්වන ප්‍රධාන මාවතක් ඇත. මේ මාවතේ ආරම්භය, මාවත දෙපැත්තේ ඉදිකර ඇති උස් කුලුනු දෙකකින් සිදුවන අතර එතැන් සිට එකම උසට පිළිවෙලින් ඉදිකර ඇති තට්ටු දෙකේ නිවෙස් පේළියක් වෙයි. ඒවා වීදියේ මෙහා කොනේ සිට එහා කොන දක්වාම එක දිගට ඉදිවී ඇත. මාවතේ දෙපැත්තෙන් නිවෙස්වලට ඉදිරියෙන් දිගු කොරිඩෝවක් ඇත. පදිකයින් වෙනුවෙන්ම නිර්මාණය කර ඇති මේ කොරිඩෝව නිමකර ඇත්තේ පොළවට ඇල්ලූ සතරැස් කුඩා කළුගල් වලිනි.

සුදු පැහැ හිමෙන් පිරීගිය ශීත සෘතුවේ ආරම්භය වන දෙසැම්බරයේ, සිහින්ව හිම වැටෙන රාත්‍රියක, ඔබ මෙම දැකුම්කළු වීදිය ඔස්සේ ඇවිද යන සැටි සිහි කරන්න.

වීදිය මුළුමනින්ම හිමෙන් වැසී ගොස් ඇත. වාහන යන්නේ ඉතාමත් අතලොස්සකි. ඒවායේ බරට මාර්ගය මධ්‍යයේ ඇති හිම තට්ටු දියවී එම වතුර ඔබ ගමන් කරන කොරිඩෝව දිගේ ඇති කානු වලින් බැස යයි. හිම තට්ටු පොඩි කරමින් ඇදී යන වාහනවල හඬත්, වීදියේ තැනින් තැනදී ඔබ ඉදිරියට එන මිනිසුන්ගේ පා ගැටෙන හඬත් හැරෙන්නට මාර්ගය සම්පූර්ණයෙන්ම නිහඬය.

හිමෙන් පිරී ඇති මෙම පදික වේදිකාව දිගේ ඉතාමත්ම සීරුවෙන් ඇවිද යන ඔබ මේ මොහොතේදී නිවෙස් පේළිය මැද ඉදිවී ඇති කුඩා උද්‍යානයකට පැමිණෙනු ඇත.

එය සම්පූර්ණයෙන්ම පාළුවට ගොස්ය. සුදු පැහැ හිමෙන් එහි ගස් මුදුන් මුළුමනින්ම වැසී ගොස්ය. ඒ 'අලෙක් මනුක්‍යාන්' උද්‍යානයයි.

ඔබ එය පසු කළ යුතුය.

එය පසු කරන සැණින් ඔබට නොම්මර 09 ලෙස අංකය සඳහන් කරන ලද සුදු පැහැ ලීයෙන් තැනූ ගේට්ටුවක් දක්නට ලැබෙනු ඇත.

මේ ගේට්ටුවෙන් ඇතුල් වන ඔබ එන්නේ එම නිවසටයි.

මා ඔබට කියන්නට යන මේ කතාව සිදුවන්නේ මෙම නිවස තුළය. 2004 දෙසැම්බර් 11 වෙනි දින, එකම රාත්‍රියක් තුළදී, රෝස නගරය නොහොත් යෙරෙවානයේදී සිදුවූ සත්‍ය සිදුවීම් දාමයක් මූලාශ්‍ර කරගෙන 'එක් දවසක් රෑ' මා මෙසේ ලියා පළ කරමි.

එක දවසක් රෑ

මුතුමුදලිගේ නිශ්ශංක

අලෙක් මනුක්‌යාන් වීදියෙහි නොම්මර නවය දරන නිවසෙහි සාදයක් පැවැත්වීමට නියමිතව ඇත. හේමා ප්‍රනාන්දු අමුත්තන්ට ආරාධනා කළ ආකාරයෙන්නම් මෙය 'රාත්‍රී භෝජන සංග්‍රහයකි'. ඇය මේ වන විටත් ඒ සඳහා කෑම මේසය සකස් කරමින් සිටියාය. කෑම මේසය හරි මැදට වෙන්නට රන්වන් පැහැ වන තෙක් බැද සකස් කරන ලද කුකුල් මස් භාජනයකී. එය වටා අර්මේනියානු ක්‍රමයට අනුව සෑදූ සපාස්, ඔජපුරි සහ මිදි කොළවලට ඇඹරූ මස් තබා සකස් කරන ලද තොල්මා දීසි තබා ඇත. ඒවායින් පසුව ලංකාවේ ක්‍රමයට අනුව සෑදූ කහ බත් පිඟානකි. එයත් සමගම වම්බටු බැදුමකුත්, මයිසූර් පරිප්පු හොද්දකුත් වෙයි. ව්‍යාංජන දීසි සියල්ලම මේසය මත තැබූ පසුව ඇය ඒ මත සිසිල් බීම සහ සෝඩා බෝතල් තැබුවාය. එයටත් පසුව වයින් සහ ෆින්ලන්ත වොඩ්කා බෝතලයකි.

අර්මේනියානුවන්ගේ කෑම මේසවල අතුරු සිදුරු නැත. කෑම මේසය කොතරම් විශාල වුවත් එය ආහාර පාන වලින් පිරී තිබිය යුතුය. එය ඔවුන්ගේ චාරිත්‍රයයි. ලංකාවේ සිට අර්මේනියාවට සංක්‍රමණය වී එහි අවුරුදු දහයකට වඩා වැඩි කාලයක් ජීවත් වූ හේමාට එය හුරුපුරුදුය.

මේසය සම්පූර්ණයෙන්ම පිරවූ පසුව ඇය පැමිණෙන අමුත්තන් වෙනුවෙන් පුටු සකස් කළාය. මේසය දිගු එකක් වූවෙන් එහි දෙපැත්තෙන් හුදකලාවේ පිහිටි පුටු දෙකකි. එහි එකක ඇයත් අනෙකේ 'ටාබෝත්' ඉඳගනු ඇත. අනෙක් දෙපැත්තෙන් පුටු දෙක බැගින් පුටු සතරකි. එක් පැත්තක් 'කියාරා සහ ඇන්තෝනියෝ' වෙනුවෙනි. අනෙක් පැත්ත 'සොෆී සහ එඩ්ගාර්' සඳහාය. එම

පුටු සය ඉදිරියෙන් පිඟන් සයක් තැබූ ඇය ඒවාට වම් පසින් ගෑරප්පුවත්, දකුණු පසින් හැන්ද සහ පිහියත් තබා මේසය යුරෝපීය ක්‍රමයට අනුව නිවැරදිවම සකස් කළාය.

භෝජන සංග්‍රහය සඳහා කෑම මේසය සූදානම්ය. ඇය එතැනින් මඳක් පිටුපසට ගොස් ඒ දෙස බලා සිටියාය. මොහොතකින්"සියල්ලම නිවැරදිව සකස් වී ඇත්තාක්" මෙන් ඇයගේ මුවින් සියුම් මඳහසක් නැගිණ. එක්වරම කෑම මේසය ඉදිරියේ බිත්තියේ වූ බට්ටා ඔරලෝසුවේ හතේ කණිසම වැදෙන්නට පටන් ගත්තේය. ඇයගේ දෑස ඒ දෙසට හැරිණි. තවත් විනාඩි තිහකින් ඔවුන් පැමිණෙනු ඇත. මේසයට විරුද්ධ පසින් සාලය කෙළවරේ ඇති ගිනි උදුන වෙතට ගිය ඇය, ඒ ඉදිරියෙහි තබා තිබුණු දර ගොඩෙන් දර පලු කිහිපයක් එතුළට ඇතුළු කර එහි වූ කම්බි ආවරණය වසා දැම්මාය. මොහොතකින් නිවස ප්‍රමාණවත් උෂ්ණත්වයකින් පිරී යනු ඇත. රාත්‍රී හිම වැටෙන මොහොතක, ගිනි උදුනක් ඉදිරියේ ඇති කෑම මේසයක් වටා ඉඳ සතුටු කතාවෙහි යෙදෙමින් රාත්‍රී ආහාරයට ගැනීමට අමුත්තන් ප්‍රිය කරනු ඇත.

ඇය ගිනි උදුන අසල ඇති දිගු වීදුරු ජනේලයෙන් පිටත බැලුවාය. සිහින් කැබලි ලෙස පොළවට හැද හැලෙන හිම පතනය තවමත් අවසන් වී නැත. ඒවා සුදෝසුදු වස්ත්‍රයක් මෙන් මනස්කාන්තව පොළව වසා පැතිර ගොස් ඇත. ඒ වස්ත්‍රය තවත් අලංකෘත කරන්නාක් මෙන් මාර්ගයෙහි ඇති විදුලි ලාම්පුවලින් නික්මෙන පාන්ඩු වර්ණය හිම පියලි මත දිදුලමින් තිබේ. මාර්ගය පාළුවට ගොස් ඇත. හිම වැටෙන සීතල රාත්‍රියක් කොයිතරම් සුන්දර වුවත්, මිනිසුන් ඒ සුන්දරත්වය විඳීමට පිටතට යාමට ප්‍රිය කරන්නේ නැත. ඒ වෙනුවට ඔවුන් කරන්නේ නිවෙස් තුළ සිට පිටත පෙනෙන සුන්දරත්වය දෙස බලා සිටීමයි. පිටතින් සුන්දරව පෙනෙන දෑ තුළ අසුන්දර, දරුණු දේ අනන්තවත් සිදුවිය හැක. ඒ නිසාවෙන් එළියට ගොස් එම සුන්දරත්වය විඳීමට මිනිසුන් බිය වෙති.

හේමා ජනේලය අසල සිටගෙන සිටියදීම ජනෙල් තීරුවල ඇති

වීදුරුවලින් පෙනෙන ඇයගේ රූපය දෙස බැලුවාය. ඇයට ඇත්තේ කළු, කොටට කැපූ කොණ්ඩයකි. තරමක් විශාල දෙනෙතකි. රවුම් මුහුණකි. ඒ සියල්ලටම වඩා ඇයගේ තළෙලු සම වඩාත් වර්ණවත් කරමින් ඇය ඇඳ සිටි තනි රතු පැහැ කොට ගවොම ඇයගේ සිරුරට ඇලී අමුතුම ලාලිත්‍යක් ගෙන දුන්නාය. එම ගවොම තුළින් මැනවින් පෙනෙන ඇයගේ සිරුරේ හැඩය දෙස ඇය මොහොතක් බලා සිටියාය. නිසැකවම 'ටාබෝ' එයට ලොල්වනු ඇත. ඔහු ඇයගේ ඉණෙන් අල්වා ඇයව ඔහුගේ තුරුලට ගනු ඇත. ඒ අසික්කිත ප්‍රීතිය ඇය විඳ දරා ගත යුතුය. රතු ගවොමට පහතින් ඇයගේ තළෙලු දෙපාත්, ඇය පැලඳ සිටි රතු පැහැ අඩි උස සපත්තු කුට්ටමත් පෙනෙයි. ඒ දෙස බලා සිටියදීම ඇය අඩිය මඳක් ඉහළට ඔසවා සපත්තුවෙන් පොළවට තට්ටුවක් දැමුවාය.

පරිසරය සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දය. එම ශබ්දය නිවස පුරා පැතිර ගොස් නිමේෂයකින්ම අතුරුදහන් විය. ඇයගේ දෙනෙත් තවමත් කණ්ණාඩියෙන් පෙනෙන රූපය මත රැඳී ඇත. එහෙත් ඇගේ දෙසවන යමක් බලාපොරොත්තුවෙන් නිශ්චලව සිටියාය. ඔරලෝසුවේ කට්ට තප්පර කිහිපයක් ඉදිරියට ගමන් කරන හඬ ඇයට ඇසුණි. ඇය තවත් ඒ නිහඬතාවයට කන් දුන්නාය.

නිමේෂයක් ගත වී ගියේය. එක්වරම නිවසේ කොහෙන් හෝ දෙවරක් තට්ටු කරන හඬ ඇයගේ කනට ඇසිණ. එය ප්‍රමාණවත්ය. ඇය එය හඳුනාගත්තාය.

වේලාව රාත්‍රී 7 යි.

කියාරා නානකාමරයෙන් එළියට ආවාය. ඇය කාමරයේ දොර විවර කරද්දි ඒ තුළින් ආ උණුසුම් වායු බිංදු නානකාමරය ඉදිරියේ වූ දිගු දර්පනය සම්පූර්ණයෙන්ම බොඳ කර දැමීය. දොර අසලවූ කොක්කෙහි එල්ලා තිබුණු තුවාය අතට ගත් ඈ ඉන් හිසකෙස් පිස දමමින් දර්පනය ඉදිරියට විත් සිටගත්තාය. දර්පනයේ වූ ජල බිංදු එක් අතකින් පිස දැමූ ඈ එයින් පෙනෙන තම නිරුවත් සිරුර

දෙස බැලුවාය. ඇයට ඇත්තේ සිහින් සිරුරකි. ඇගේ රන්වන් පැහැ කොටට කැපූ කොණ්ඩය දිගේ වතුර බිංදු බේරෙමින් සිරුර දිගේ පහළට ගලා ගෙන යයි. ඇයගේ කොළ පැහැති දෑස පියයුරු දෙසට යොමු විය. ඈ ඒ දෙස මඳ වෙලාවක් බලාගෙන සිටියාය. ඇයගේ සිතුවිලි තුළ මතකයන් කැකෑරෙමින් තිබිණ.

"ඔබේ පියයුරු හරි ලස්සනයි කෙල්ලේ, මට ආසයි ඒ රෝස පාට තුඩ කට ඇතුළේ තියාගෙන උරන්න"

ඒ වචන මතකයට එත්ම ඇගේ මනස රාගයෙන් දැවී යන්නට විය. ඇය එක් අතකින් තම පියයුරු පිරිමදින්නට පටන් ගත්තාය. එක් ඇඟිල්ලක් පියයුරු තුඩට රැගෙන ආ ඈ එය සෙමෙන් පිරිමැද්දාය. ඇයගේ මනස තමා කිසිම දවසක නොදුටු එම රූව වෙත ඇදී ගියාය. ඈ දෙනෙත් වසාගෙන, ඔහුගේ මුව තම පියයුරු තුඩෙහි වැදෙන සැටි සිතින් අත් විඳින්නට පටන් ගත්තාය. ඒවා පොපියන පොහොට්ටුවක් මෙන් ක්‍රමයෙන් අවදිවන අයුරු අත් වින්දාය. ඇගේ අනිත් අත කෙමෙන් නාභියටත් එතනින් පහළටත් ඇදී යන්නට විය. එහෙත් එක්වරම, දර්පනය ඉදිරියේ වූ ආධාරකයේ තබා තිබුණු ජංගම දුරකථනයෙන් 'බීප්' හඬක් නැගුණෙන් මෙතෙක් රැඳී සිටි රාගික ස්වප්නයෙන් අවදි වන්නට ඇයට සිදුවිය. ඒ කෙටි පණිවිඩය ඇය බලාපොරොත්තුවෙන් සිටින එකනම් එය සැබැවින්ම හාස්කමකි. ඇය පණිවිඩය විවර කර බැලුවාය.

"මට ඔයාව මතක් වෙනවා කෙල්ලේ, මට ඒක බලන්න ඕනේ" එහි සඳහන් වී තිබිණ.

එය දකිත්ම ඇය එක් අතකින් කට වසා ගත්තාය. විශ්මයෙන් ඇයගේ දෑස විශාල වී ගියේය.

"නොයෙල්, නොයෙල්, ඔයා නම් පුදුමයි" ඇය තමාටම මුමුනා ගත්තාය.

ඇය එයට පිළිතුරු ලෙස කිසිවක් ලියුවේ නැත. ඒ වෙනුවට එක් අතකින් යළිත් දර්පනය පිස දැමූ ඈ, එයින් පෙනෙන තම නිරුවත් උඩුකයෙහි ඡායාරූපයක් ගත්තාය. එය කෙටි පණිවිඩයට අමුණා යැව්වාය.

පණිවිඩය යැවූ පසු ඉක්මනින්ම එය මකා දැමූ ඈ ජංගම දුරකථනය යළිත් ආධාරකයේ තබා, තෙත්වූ හිසකෙස් පිහදාන්නට පටන් ගත්තාය. ඔහු යළිත් කිසිවක් නොලියනු ඇත. ඔවුන්ගේ ගිවිසුම වූයේ එයයි. එක් දවසකට එක් නිරුවත් පිංතූරයක්. ඔහු ඇයවත්, ඇය ඔහුවත් කිසි දිනෙක දැක තිබුණේ නැත. කියාරා යැවූ නිරුවත් පිංතූරවල ඇයගේ මුහුණවත් ඔහු විසින් ඇයට එවා තිබුණු නිරුවත් පින්තූරවල ඔහුගේ මුහුණවත් නොවීය. එය දෙපැත්තටම වාසිදායකය. දෙදෙනාම ආරක්ෂිතය. කියාරා මේ සඳහා භාවිතා කළ අංකයත් ඇයගේ සත්‍ය දත්තයන්ගෙන් තොර වූ ව්‍යාජ එකකි. ඒ නිසාවෙන් ඒ ගැනත් බිය වීමට කාරණයක් නැත.

ඇය කොණ්ඩය පිසදමා තුවාය නාන කාමරයේ තිබුණු කොක්කෙහි එල්වා, එතැන වූ දිගු ලෝගුව ඇඳගන්නට සැරසුණාය. එහෙත් ඒ සමගම නානකාමරයේ දොරට තට්ටු කරන හඬ ඇසිණ. ඈ ගොස් දොර විවර කළාය.

"කියාරා මෙච්චර වෙලා මොනවද කරන්නේ? දැන් වෙලාව හතත් පහුවෙලා"

ඇන්තෝනියෝ දොර ඉදිරියේ හිටගෙන කියවන්නට පටන් ගත්තේය. කියාරා ඒ ගැන සැලකිල්ලක් යොමු කළේ නැත. ඇය ලෝගුව සිරුරට හොඳින් ඇලවෙන ලෙස ගැට ගසාගෙන නානකාමරයෙන් එළියට යන්නට සැරසුණාය. එහෙත් දොර අසලදී ඇයව දැතින්ම අල්වා ගත් ඇන්තෝනියෝ ඇයව බිත්තියට තල්ලු කර රඳවා ගත්තේය.

"තවම තරහද?"

"නැහැ, මාව අත හරින්න, මට ලෑස්ති වෙන්න ඕනේ"

ඇන්තෝනියෝ ඇයව අත හැරියේ නැත. බිත්තියට තදකර අල්වා සිටියදීම ඇගේ තුවා ලෝගුවෙන් එළියට නෙරා විත් තිබුණු පියයුරු දෙස බලා සිටියේය. ඒ සමගම ඇයගේ ඉඟ වටා අතක් යවා ඇයව සිය පපුවට තුරුලු කර ගත්තේය. එහෙත් කියාරා එයට විරුද්ධ වූවාය.

"දැන් බැහැ. මම දැන් ලෑස්ති වෙන්න ඕනේ"

ඒ වචනයත් සමගම ඇන්තෝනියෝ තම ග්‍රහණය ලිහිල් කළේය.

"මම දන්නේ නැහැ ඔයාට මොන යකා වැහිලද කියලා. වෙච්ච දේ ඉවරයි, ඇයි තවමත් ඒක හිතේ තියාගෙන ඉන්නේ?" ඔහු වේගයෙන් ඇසුවේය.

"මම කිසිම දෙයක් හිතේ තියන් නැහැ, දැන් වෙලාවක් නැහැ. පරක්කු වෙනවා එච්චරයි. මම යනවා ලෑස්ති වෙන්න"

කියාරා ඇන්තෝනියෝගේ අත ගසා දමා එතැනින් යන්නට ගියාය.

කියාරා ටික වෙලාවකින්ම සූදානම්වී පහත මාලයට ආවාය. ඈ එන විට ඇන්තෝනියෝ ඔවුන්ගේ එකම දරුවා ඔඩොක්කුවේ තබාගෙන හුරතල් කරමින් සිටියේය. කියාරා පියගැට පෙළ ඔස්සේ පහතට එනු දුටු ඔහු දරුවා මෙහෙකාරියගේ අතට දී නිවසින් පිටව, එළියේ නවතා තිබුණු කාරය දෙසට ගියේය.

පහත මාලයට පැමිණි කියාරා එතැන මොහොතකට නැවතුණාය. තම දරුවා අතට ගත් ඈ ඔහුව ඉහළට ඔසවා ඔහුගේ පාදයකට හාද්දක් දුන්නාය. දරුවා හුරතල් සිනහවක් පාන්නට විය.

දරුවාව යළි පිලිපීන මෙහෙකාරියගේ අතෙහි තැබූ ඈ"අම්මට පරක්කු වෙනවා" කියමින් මෙහෙකාරිය දෙස බැලුවාය.

"මීලා, අපි දොළහ වෙන්න කලින් එනවා. මොකක් හරි හදිස්සියක් වුණොත් මගේ මොබයිල් එකට කෝල් එකක් දෙන්න, දොරවල් හොඳට වහන්න, කවුරු තට්ටු කළත් දොර අරින්න එපා, තේරුණාද?"

"ඔව් කියාරා" පිලිපීන මෙහෙකාරිය හිස වනමින් පැවසුවාය.

ඒත් සමගම බිළිඳාගේ මුවට යළිත් හාදුවක් දුන් කියාරා නිවසින් පිටතට විත් කාරයේ ඉඳගත්තාය. ඇය තමා සමග කතා කරතැයි ඇන්තෝනියෝ සිතුවත්, ඈ කිසිත් නොකියා නිහඬව ජනේලයෙන් පිටත බලාගෙන සිටියෙන් දිගු සුසුමක් හෙළූ ඇන්තෝනියෝ කාරය පණ ගන්වා එතැනින් නික්මෙන්නට විය.

වේලාව රාත්‍රී 7.30

හරියටම වේලාව පස්වරු 7.30 වන විට දොරෙහි සීනුව නාද විය. හාන්සි පුටුවේ ඉඳගෙන සිටි හේමා නැගිට්ටාය. ඉදිරියේ තිබුණු ඔරලෝසුවේ වේලාව දෙස බැල්මක් හෙළු ඇගේ දෑස වික්ෂිප්තව ගියේය. ඒ කවුරුන්දැයි ඈ දැනගෙන සිටියාය. එක්කෝ ඔහු හරියටම 7.30ට පැමිණෙන්නට ඇත. නැතහොත් වේලපහ පැමිණ, ගිවිසගත් වේලාව එනතුරු නිවසට නොපැමිණ එළියෙහිම රැඳී සිටින්නට ඇත. ඇය දණහිස ළඟට කොට, ඇඟට හිර වූ ගවොම මඳක් හරිගස්වාගෙන ගොස් දොර විවර කළාය.

දොර විවර කළ සැණින්ම එළියේ සිටි ටාබෝ අලංකාර නැටුමක ලීලාවකින් පාදයන් නටවා, පැරණි රාජකීයයන්ට ගෞරව දක්වන්නාක්සේ පහතට නැමී හාස්‍යජනක ස්වරයකින්"හේමා මැතිනියනි, මා ඔබේ නිවහනට හරි වෙලාවටම ආවා" යැයි පවසා, ඔහුගේ අතේ වූ වයින් බෝතලය හේමාගේ අතෙහි තැබුවේය. හේමා සිනාසෙන්නට වූවාය. ඒ සිනහවෙන් ඇයගේ විශාල දෙනෙත් මඳක් පුංචි වී, මුහුණේ තළෙලු සම දෙපසට ඇදිණි. එය ඇගේ මුහුණට මනරම් වූ චමත්කාරයක් ගෙන ආවාය.

"ටාබෝ, මොකද අනේ මේ?" ඇය ලැජ්ජාවෙන් ඇසුවාය.

ටාබෝ සිනාසී ඇය අසලට විත්, ඇයව තදින් වැළඳ ගත්තේය. ඇයගේ සිරුර ඔහුගේ ශරීරයට දැඩිව තෙරපෙන සේ කළ මේ වැළඳ ගැනීම ගැන හේමා තුළ සතුටක් නොවූවත් ඇය එය ඔහුට නොපෙන්වීමට දැඩි වෙහෙසක් දැරූ බැව් කිව යුතුය. ඔහු තත්පර කිහිපයක් යන තුරුම ඇයව නිදහස් කළේ නැත. ඔහුගේ කළු, ඝන කබායෙන් එන සිගරට් ගඳ පවා හොඳින් දැනෙන ලෙස ඇයගේ නාසය ඔහුගේ කබායට තදවී තිබිණ. ඔහු ශීත කාලයට අඳින දිග කළු කබායක් ඇඳ සිටි අතර හිම වැස්ස නිසා එහි උරහිස් හිම පියලිවලින් තෙත් වී ඇත. ඔහු ඇයගේ ගෙල සිඹින්නට පටන්

ගත්තේය.

"මට මේ සුවඳ මගහැරිලා තියෙන්නේ කෙල්ලේ. ඔයාව දැක්කේ මාස හයකට විතර පස්සේ, අන්තිම වතාවේ අපි ජර්මුක්වලදී හමු වුණාට පස්සේ මුණ ගැහුණේ අද. මට මේ සුවඳ හොඳටම මග හැරුණා"

ඔහු ඇයගේ බෙල්ලට හාදු දෙන ගමන් පැවසීය. හේමා තමා අත තිබුණු වයින් බෝතලය ඔහුගේ පපුවට තබා ඔහුව තම සිරුරින් මඳක් ඈතට තල්ලු කළාය. ඒත් සමඟම යළිත් පියවි සිහියට පැමිණියාක් සේ ටාබෝ ඇයව සම්පූර්ණයෙන්ම නිදහස් කොට, ඔහු ඉදිරියේ එක එල්ලේම පෙනෙන සාලය දෙස බැලීය. ඒ බැල්මෙන් ඔහුගේ සිහිය සම්පූර්ණයෙන්ම හේමාගෙන් ඇත්ව ගියාක් සේ විය. එය දැකුම්කළුය.

නිවසට ඇතුළුවන දොර ඉදිරියේම ඇත්තේ පටු කොරිඩෝවකි. අඩි දහයක් පමණ වූ මේ කෙටි කොරිඩෝවෙන් පසුව ඇත්තේ නිවසේ ප්‍රධාන සාලයයි. මෙම කොරිඩෝ බිත්තිය දිගේ එක දිගට ශ්‍රී ලංකාවේ අත්කම් මෝස්තර යොදා කළ ලී වෙස්මුහුණු කිහිපයක් එල්ලා ඇත. එයට පසුව එක එල්ලේ පෙනෙන සාල බිත්තියේ සීගිරි ලලනාවන්ගේ විශාල කරන ලද ඡායාරූපයකි. දොර අසල සිට බැලූ විට හරි කෙලින් පෙනෙන මෙම ඡායාරූපයෙන් බිත්තිය පිරී ඇත්තාක් සේ හැඟෙයි. ඊට එහායින් මවකගේ සංවේදී මුහුණක් සහිත, පෙර සිතුවමට වඩා ප්‍රමාණයෙන් කුඩා චිත්‍රයකි.

වෙස්මුහුණු දෙස බලාගෙන කොරිඩෝව දිගේ ඉදිරියට පැමිණි ටාබෝ කොරිඩෝව අවසානයේදී සාලය දෙසට හැරුණේය. සාලය මුළුමනින්ම සුදු පැහැයෙන් පාට කර ඇත. එහි එක් පැත්තක, බිත්තියේ පාටටම ගැළපෙන සුදු පැහැ දිගු සෝපාවකි. සෝපාව ඉදිරියේ එහි අතිරේක සෝපා පුටු දෙකත් කුඩා තේ මේසයකුත් ඊට නුදුරෙන් බිත්තියේ සවිකළ ලොකු රූපවාහිනි යන්ත්‍රයත්, එතැනම පැරණි ග්‍රැමෆෝනයත් වෙයි. ඒවාට පසුව තරප්පුවක් තරම් ඉහළට එසවෙන සේ ඉදිකර ඇති උඩු සාලයෙහි එක් පැත්තකින් කෑම මේසයත්, කෑම මේසයට විරුද්ධ පසින් ගිනි ඇවුලූ පෝරනුවත්, ඒ දෙකට මැදින් සාලය අවසන් වන

බිත්තියෙහි භාගයක්ම පිරී යන පරිද්දෙන් ඉදිකර ඇති දිගු විදුරු ජනේලයත් වෙයි. මෙම වීදුරු ජනේලයේ ඉහළ සිට පොළවට වැක්කෙරෙන පරිදි රෝස පැහැ විචිත්‍රවත් තිරවලින් අලංකාර කර ඇති අතර, ඒවා අතරින් පෙනෙන ජනේලයෙන් පිටත දර්ශනය හිම වැටෙන රාත්‍රියක චිත්‍රයක් මෙන් අලංකාරයෙන් දිදුලමින් ඇත. මා කලින් කී බට්ටා ඔරලෝසුව ඇත්තේ මේ ජනේලයට ඉහළිනි. කෑම මේසයට විරුද්ධ පසින් ඇත්තේ උඩු මහලට යන තරප්පු පෙළත්, සාලයේ බිත්තියෙන් බෙදී ඇති කුස්සියත් පමණකි.

"හේමා , හේමා, හේමා" සාලය මැදට පැමිණි ටාබෝ එම සුන්දරත්වයෙන් මත් වූවෙකු සේ මුමුනන්නට පටන් ගත්තේය. හේමා ඔහුගේ පිටුපස හිටගෙන සිටියාය.

"ඔයා මේ ගේ ලස්සනට තියාගෙන ඉන්නවා" කී ඔහු යළිත් හේමා ළඟට විත් ඇයව තුරුලට ගත්තේය. මෙවර ඇයගේ තට්ටමෙන් අල්වා ඇයව පපුවට කරගත් ඔහු

"මගේ කෙල්ල, ඔයා වගේම ඔයාගේ ගේත් ලස්සනයි" යැයි කීවේය.

ඔහු තම දෙතොල් ඇයගේ මුහුණ අසලටම ගෙන ආවේය. තවත් මොහොතකින් ඔහු හාදුවක් දීමට අර අදිනු ඇත. හේමා එය දැන සිටියාය. ඇය ඔහුගෙන් මිදෙන්නට පොටක් සෙව්වාය. වේලපහම සිදුවූ මේ අසික්කිත වැළඳගැනීම් වලින් ඇයගේ මනස අවුල් වී ඇත. ඒ සේරටමත් වඩා ඔහු දමනය කළ නොහැකි කුළුමීමෙකු තරම් උස, හැඩිදැඩි ශරීරයක් ඇති කෙනෙකි. ඔහු හේමාව සම්පූර්ණයෙන්ම ඔහුගේ ග්‍රහණයට නතු කරගෙන තිබිණ. ඔහුව තල්ලු කර දැමීමට තරම් ආවේගයකින් ඈ පෙළුණාය. බලහත්කාරයෙන් හාද්දක් දීමට තැත් කළහොත් හේමා නිසැකවම ඔහුව තල්ලු කර දමනු ඇත.

එහෙත් එය ඇයගේ සැලසුමේ නොතිබුණෙන් ඇය තැතිගත්තාය. ඔහුගෙන් මිදී යාමට පොටක් සෙව්වාය. මේ මොහොතේදී ඇයගේ සිතට අස්වැසිල්ලක් වෙමින් නිවසේ සීනුව යළිත් නාද වෙන්නට පටන් ගත්තේය. එයින් යළි ප්‍රාණය උපදවා ගත් හේමා ටාබෝව ඇත් කොට විත් දොර විවර කළාය.

දොර විවර කරත්ම සොෆී ඇයව වැළඳ ගත්තාය. සොෆී අර්මේනියානු ජාතික කාන්තාවකි. වයස අවුරුදු විසි පහක් පමණ වූ ඇයත්, ඇයගේ ස්වාමිපුරුෂයා වූ එඩ්ගාර් සිමෝන්යාන්ද එතැන සිටියහ.

"හේමා, මේ මගේ මහත්තයා, එඩ්ගාර්" ඇය හේමාට ඔහුව හඳුන්වා දුන්නාය. හේමා ඔහුට අතට අත දීමට සූදානම් වුවත් ඔහු ඉදිරියට විත් හේමාගේ කම්මුලකට හාදුවක් දුන්නේය. එය අර්මේනියානු චාරිත්‍රයයි. ඔවුන්ද යුරෝපීයයන් මෙන්ම අතට අත දීමේ චාරිත්‍රයට වඩා මුහුණට හාදුවක් දී පිළිගැන්වීමේ චාරිත්‍රයට ප්‍රිය කළවුන්ය. සොෆී ඩෙනිමකින් සහ කපු ස්වීටරයකින් සැරසී සිටි අතර, එඩ්ගාර්ද ඩෙනිම් කලිසමින් සහ ඝන ශීත කබායකින් සැරසී සිටියේය.

"එන්න ඇතුළට" කියූ හේමා ඔවුන්වත් රැගෙන කොරිඩෝව දිගේ ප්‍රධාන සාලයට පැමිණියාය. සාලයට එත්ම සෝපාවේ ඉඳගෙන සිටි ටාබෝ එතැනින් නැගිට ඔවුන් ඉදිරියට ආවේය.

"මේ ටාබෝ, මගේ හොඳ යහළුවෙක්" කී හේමා, සොෆී සහ එඩ්ගාර්ට ඔහුව හඳුන්වා දුන්නාය. මේ හඳුන්වා දීමෙන් ටාබෝගේ මුහුණේ මෙතෙක් තිබුණු සිනහව මැකී ගියේය. ඔහු දෑස පුංචි කර හේමා දෙස බැලුවේය.

"යහළුවෙක්" යැයි හේමා ඔහුව හඳුන්වා දුන්නේ ඇයි දැයි හේ සිතන්නට ඇත. ඔහු සිතූ ආකාරයට හේමා සහ ඔහු අතර ඊටත් වඩා සම්බන්ධයක් තිබිණ.

එඩ්ගාර් ඉතාමත් විනීත ලීලාවකින් ටාබෝට අතට අත දී ආචාර කළේය.

"ටාබෝ යෙරෙවාන්වලද?" ඔහුට අතට අත දෙන ගමන් එඩ්ගාර් ඇසුවේය.

"නැහැ මම ජර්මුක්වල"

"එහෙනම් දවල්ම එහෙන් එන්න ඇති"

"ඔව්, හිම පතනය වැඩි නිසා ජර්මුක්වල ඉඳන් යෙරෙවාන්වලට එන එක ලේසි නැහැ, පැය හයක් එක දිගට මහා පාරේ" කී ටාබෝ හේමා දෙස හැරුණේය.

"ඒත් හේමා එන්න කිව්වම නැවිත් ඉන්නත් බැහැනේ" ඔහු එය කීවේ හේමාගේ දෑස දෙස හරි කෙලින් බලමිනි. ඔහුට තිබුණේ කුඩා නිල් දෑසක් නිසාවෙන් එසේ පවසද්දි ඒවා නිල් පාටින් දිලිසුම් දුන්නේය.

හේමා ඔහුගෙන් ඇස් ඉවතට ගෙන සොෆී දෙස බලා මෙසේ ඇසුවාය.

"කෝ පුතා ආවේ නැද්ද?"

සොෆීගේ මුහුණ වෙනස් වී ගියාය. ඒවායේ වූ සතුට ඒ ප්‍රශ්නයෙන් අතුරුදහන් වූ බැව් කියත හැක.

"නෑ හේමා, පුතාව අපි ඩිලිජ්‍යාන් උසස් පාසලට මාරු කළා. එයා ආයෙත් යෙරෙවාන්වලට එන්නේ වසන්ත කාලෙට, එතකන් එයා ඩිලිජ්‍යාන්වලම නේවාසිකව ඉගෙන ගන්නවා"

ඇය සුදුමැලි වූ මුහුණින් යුක්තව කීවාය.

ඇය එසේ කියත්ම හේමා සොෆීව වැළඳ ගත්තාය. සමහරක් වැළඳ ගැනීම්වලට ඇත්තේ හාස්කමකි. ඒවායින් දුකින් දැවී යන හදවත් සුමට කළ හැක. එම ස්පර්ශයට හදවතට දැනෙන වේදනාව නැතිකර දැමිය හැක. සොෆීද එයින් සැනසීමක් ලැබුවාය.

සොෆී සහ එඩ්ගාර් විවාහ වූයේ මීට වසරකට පමණ පෙරාතුවය. ඔවුන්ගේ විවාහයෙන් මාස කිහිපයක් පමණක් ගෙවී යද්දී සොෆීගේ සහෝදරිය සහ ඇයගේ සැමියා දරුණු රිය අනතුරකින් මරණයට පත්විය. එයින් පසුව ඔවුන් දෙපළගේ එකම දරුවා අනාථයෙකු වූයෙන් ඔහුව රැකබලා ගත්තේ සොෆී සහ එඩ්ගාර් විසිනි. ඔවුහු එම දරුවාට තමන්ගේම දරුවෙකුට මෙන් ආදරය කළෝය. දෙමව්පියන් ලෙස ඔහුට දිය හැකි සෑම සැප සම්පතක්ම ලබා දෙමින් ඔහුව තමන්ගේ ජීවිතයේම කොටසක් කර ගත්තෝය.

වයස අවුරුදු එකොළහක පමණ පිරිමි දරුවෙකු වූ හේ ඩිලිජ්‍යාන් පාසැලක ඉගෙන ගත්තේය. යෙරෙවානයේ සිට ඩිලිජ්‍යාන්වලට යෑම ලේසි පහසු කාර්යයක් නොවේ. එයට පැ තුනකටත් වඩා කාලයක් වැය කළ යුතුය. ශීත කාලයේනම් එය බෙහෙවින්ම අපහසු කාරියකි. එහෙයින් ශීත කාලයේදී පාසැල්වලට ඇතුළුවන

ළමුන් පාසැලේම නේවාසිකව නැවති අධ්‍යාපනය ලබන අතර වසන්ත කාලයේදී ඔවුහු යළිත් නිවෙස්වලට පැමිණියාහ.

වේලාව රාත්‍රී 8 යි

රාත්‍රී භෝජන සංග්‍රහය මේ මොහොත වන විට ආරම්භ කිරීමට හැකිවුවත් හේමා අමුත්තන්ගෙන් සමාව ඉල්ලා තවත් හෝරා භාගයකට පමණ එය කල් හරින්නට තීරණය කළාය. ඒ ඇයගේ තවත් මිතුරන් දෙදෙනෙකු නිවසට ආ යුතුව තිබුණු නිසාවෙනි. ඒ ලැබුණු කෙටි කාලයේදී ග්‍රැමෆෝනය මත තැටියක් තැබූ ඇතාතා සිමෙන්යාන්ගේ ගීතයක් වන"මෙන්ක් සීරුමෙම්" නොහොත්"මේ අපේ ආදරයයි" ගීතය එහි වාදනය කරවූවාය.

එය වාදනය වෙද්දි"එන්න අපි නටමු" කී ටාබෝ ඇයගේ අතින් ඇදගෙන සාලය මැදට ආවේය. මේ ගීතය අර්මේනියාවේ ජනප්‍රියම ගීයකි. එසේම යුගල නර්තනයන් සඳහා ඉමහත් ප්‍රසිද්ධ ගීතයක් වූයෙන් එයට නර්තනය නොකළහොත් මෙවන් ප්‍රීතිමත් රාත්‍රියක එය අඩුවක් වනු ඇත. ටාබෝ හේමාගේ දෑත ගෙන තාලයට අඩිය තබමින් නටද්දී සෝපාවේ ඉඳ සිටි එඩ්ගාර් සහ සොෆීත් එයට එකතු වූහ. ක්‍රමයෙන් සාදයේ ඇරඹුම ප්‍රීතිමත් වන්නට විය. ගීතයෙන් සහ නර්තනයෙන් නිවසේ සාලය අලංකෘත වෙද්දී හේමා ඔරලෝසුව දෙස බැලුවාය. වේලාව 8ත් පසුවී ඇත.

කාලය කෙමෙන් කෙමෙන් ගලා යන්නට විය. තාතා සිමෝන්යාන්ගේ මෙන්ක් සිරුමෙම් ගීතයෙන් පසුව තවත් ගීත කිහිපයක් නොනවත්වා තැටියෙන් වාදනය විය. ටාබෝ නැටුම නැවැත්තුවේ නැත. ඔහු හේමාගේ දෑතින් අල්වාගෙන ගීත කිහිපයකටම නැටුවේය. හේමා මහන්සියට පත්ව ඉඳගත් පසු ඔහු සොෆී ළඟට කිට්ටු විය. එඩ්ගාර්ගේ අතින් සොෆීව උදුරා ගත් ඔහු ඇයත් සමග නටන්නට පටන් ගත්තේය. එඩ්ගාර් සෝපාවේ ඉඳගෙන ඒ දෙස බලා සිටියේය. මෙය සාදවලදී ඉතාමත් සාමාන්‍ය දෙයකි, ප්‍රීතිවන අවස්ථාවේදී අර්මේනියානුවන් හොඳින් ප්‍රීති වීමට දන්නා පිරිසකි. ඒ නිසාවෙන් එඩ්ගාර්ගේ සිතේ ඒ ගැන කහටක් මතුවූයේ නැත.

එහෙත් හේමා තවත් සුළු මොහොතකින් ටාබෝ නිසා සාදයට අකරතැබ්බක් වේවීයි යන බියෙන් තැතිගත්තාය. කාන්තාවක් අතට ආ විට ටාබෝට පාලනයක් නොමැත. ඇය විටෙක බිත්තියේ වූ ඔරලෝසුව දෙසත්, ටාබෝ සහ සොෆී දෙසත් බලමින්, ඉක්මනින්ම අනිත් දෙදෙනාව එතැනට ගෙන්වා දෙන්නැයි දෙවියන්ට මුමුනමින් සිටියාය. එසේ නොවූවොත් ඇගේ සැලැස්ම පටන් ගත් මොහොතෙහිම නිශ්ඵල වී යනු ඇත.

තප්පර කිහිපයක් ගෙවී ගියේය. හාස්කමකට මෙන් එක්වරම දොරෙහි සීනුව නාද වන්නට පටන් ගත්තේය. හේමාගේ මුහුණෙහි සිනා රේඛාවන් මතුවිය.

"ඇති යාන්තම් අනිත් දෙන්නත් ඇවිත්" යැයි පවසමින් දොර අසලට යන්නට වුවාය.

ඇය දොර විවර කරත්ම ඒ අසල හිටගෙන සිටි කියාරා මුහුණ පුරා ඇදී ගිය ව්‍යාජ සිනහවක් මවා ගනිමින් ඇයව වැළඳ ගත්තාය. වැළඳ ගන්නා ගමන් හේමාට මෙසේ පැවසුවාය.

"සමාවෙන්න හේමා, බබාව බලාගන්න කෙනා එන්න පරක්කු වුණා, ඒකයි අපිට වෙලාවට එන්න බැරි වුණේ"

"කමක් නැහැ කියාරා, ඔයාලා කොහොම හරි ආවනේ. ඒ ඇති" කී හේමා ඔවුන්ව නිවස තුළට ආරාධනා කළාය.

නිවසට පැමිණෙද්දී කියාරා ඇන්තෝනියෝගේ අතක් අල්වා ගත්තාය. ඇන්තෝනියෝ කිසිවක් කීවේ නැත. කියාරා මැවුම්කාරියකි. ඇයට ඕනෑම අවස්ථාවකට උචිත වන ආකාරයට වෙනස් වීමට විශේෂ හැකියාවක් ඇත. අවස්ථානුකූලව තම සැමියාව වුවද අතකොලුවක් කරගත යුතුනම් ඇය දෙවරක් නොසිතා එය ඒ ආකාරයෙන්ම සිදුකළාය. ඇයගේ රඟපෑම් හොඳින් දැන සිටි නිසාවෙන් නිවෙසෙහි කොරිඩෝව දිගේ සාලයට පැමිණෙද්දී හේමාට නොපෙනෙන්නට ඔහු කියාරාගේ අත ගසා දැමුවේය. කියාරා රතු පැහැ කබායකින් සහා දුඹුරු පැහැ ගවොමකින් සැරසී සිටි අතර, ගවොමේ පාටටම දුඹුරු පැහැ අඩි උස සපත්තු පැලඳ සිටියාය. ඇන්තෝනියෝ සරල නමුත් කඩවසම් ආකාරයේ

ඩෙනිම් කලිසමකින් සහ එයට යට කෙරූ සුදුපැහැ කමිසයකින්ද කළු දිගු කබායකින්ද සැරසී සිටියේය.

හේමා සාලයේ සිටි පිරිසට කියාරා සහ ඇන්තෝනියෝව හඳුන්වා දුන්නාය.

"මේ දෙන්නනම් අර්මේනියානුවන් වෙන්න බැහැ" ඔවුන්ව පිළිගන්නා ගමන් ටාබෝ පැවසුවේය.

"නැහැ, අපි ඉතාලි ජාතිකයින්" කියාරා පිළිතුරු දුන්නාය.

ටාබෝ එයින් සෑහීමකට පත් වෙන බව පෙනෙන්නට නොතිබිණ.

"ඉතාලියේ අය මොකක්ද අර්මේනියාවේ කරන්නේ?" ඔහු ඇසුවේය. මෙතෙක් නිශ්ශබ්දව සිටි ඇන්තෝනියෝ මේ මොහොතේදී කතා කළේය.

"මට යෙරෙවාන්වල ඉතාලි රෙස්ටුරන්ට් එකක් තියෙනවා, අපි ඒ නිසා තීරණය කළා අර්මේනියාවෙම නවතින්න. අනික අපි මීට අවුරුදු කිහිපයකට කලින් මේ රටේම ඉගෙන ගත්තු අය."

"ඉගෙන ගත්තා? ඒ කොහේද?" ටාබෝ ඇසුවේය.

"මම කෙවූතීවල, කියාරා යෙරෙවාන් විශ්ව විද්‍යාලයේ"

"ඔව්, අවුරුදු තුනකට විතර කලින් අර්මේනියාවෙම" කියාරා එයට පිළිතුරු බඳිත්ම හේමාගේ මුහුණ අඳුරු වී ගියේය. ඇයගේ මනස තුළට කිසියම් වූ සිතුවිල්ලක් කිඳා බැසගත් බැව් එයින් පෙනෙන්නට තිබිණ. ඇය එය යටපත් කරගෙන, පිරිසගේ අවධානය ඇය වෙත ගැනීමට දැත එකතු කර අත්පුඩියක් ගැසුවාය.

"හරි, දැන් හැමෝම ඇවිත් ඉන්න එකේ මම කැමතියි ඔයාලා හැමෝටම කෑම මේසයට ආරාධනා කරන්න" කී ඇය සාලයේ කොනේ සුදානම්ව තිබුණු කෑම මේසය දෙසට අත දිගු කර පෙන්වූවාය.

වේලාව රාත්‍රී 8.30 යි

කෑම මේසයෙහි උන් අය ආහාරයට පෙර කතාවට වැටුණෝය. කෙටි සුහද කතාවකින් පසුව හේමා ඔවුනට කෑම මේසයේ තිබුණු, ඔවුන් මෙතෙක් භුක්ති විඳ නොමැති ශ්‍රී ලාංකික ආහාර පාන කිහිපය පිළිබඳව විස්තරයක් කළාය. සියල්ලෝම එම විස්තරය කුතුහලයෙන් යුක්තව අසා සිටියෝය. එම විස්තරයෙන් පසුව,

"පටන් ගන්න කලින් තවත් දෙයක් තියෙනවා මේසයෙන් තියන්න" කී හේමා මැද සාලයේ වීදුරු කබඩය විවර කොට, එහි තිබූ ඉස්තරම්ම වර්ගයේ අර්මේනියානු"මානේ" කොන්යැක් බෝතලයක් ගෙනවිත් මේසයේ තැබුවාය.

රුසියාව වොඩ්කාවලටත්, යුරෝපය වයින්වලටත් ප්‍රසිද්ධ සේම අර්මේනියාව කොන්යැක්වලට ප්‍රසිද්ධියක් උසුලයි. කොන්යැක් බෝතලයක් නැති සාදයක් ප්‍රීතියකින් තොරවූ, මළගෙයක් ලෙස අර්මේනියානුවෝ හැඳින්වූයේ මේ නිසාය. කොන්යැක් බෝතලය ගෙනවිත් මේසය මත තැබූ හේමා ඇයගේ ආසනයට ඉදිරිපස වූ ආසනයේ ඉඳ සිටි ටාබෝ දෙස සෘජු බැල්මක් හෙළුවාය.

ඒ බැල්මෙන් හේමා පවසන්නේ කුමක්දැයි ඉවෙන් මෙන් වටහා ගත් ටාබෝ පුටුවෙන් නැගිට විත් ඈ විසින් මේසය මත තබනු ලැබූ කොන්යැක් බෝතලය අතට ගෙන, එහි මූඩිය ගලවා, අමුත්තන් ඉදිරියේ තබා තිබුණු කුඩා වීදුරුවලට කොන්යැක් වත්කරන්නට පටන් ගත්තේය.

සාදයක් අරම්භ කිරීමට පෙර මත්පැන් බෝතලය විවර කර, ඒවා පැමිණ සිටින අමුත්තන්ගේ වීදුරුවලට වත්කිරීමේ චාරිත්‍රය නිවසේ ප්‍රධානියා විසින් සිදු කළ යුතු දෙයකි. එහෙත් නිවසේ ප්‍රධානියා කාන්තාවක් නම් එය පැමිණ සිටින අමුත්තන්ගෙන් පිරිමි කෙනෙකුට කළ හැක. අර්මේනියානු භෝජන සංග්‍රහයක් හෝ සාදයක් ආරම්භ වන්නේ එම චාරිත්‍රයත් සමග මත්පැන් වීදුරුව ඔසවා, සාදයට ආරාධනා කළ තැනැත්තා පවසන්නාවූ ප්‍රිය වදනකින් හෝ කරන්නාවූ ස්තුති කිරීමකිනි.

ටාබෝ සියල්ලන්ගේම වීදුරුවලට කොන්යැක් වත් කළ පසුව හේමා ඇය අසල වූ කොන්යැක් වීදුරුවත් ගෙන නැගිට සිටියාය. එතැන සිටි පස් දෙනා දෙසම සිනාමුසු මුහුණකින් යුක්ත ළයාන්විත බැල්මක් හෙළමින් මෙසේ පැවසුවාය.

"මගේ තාත්තා මට හැම වෙලේම කියපු කතාවක් තියෙනවා. මම ඒ කතාවෙන් මේ සාදය පටන් ගන්නම්, එයා මට කිව්වා... දුවේ ජීවිතය කියන්නේ දවස්වලවත්, මාසවලවත්, අවුරුදුවලවත් එකතුවක් නෙමෙයි, ජීවිතය මොහොතවල් ගොඩක එකතුවක්. අපි මේ ගත කරන මොහොත තුළ ගොඩක් දේවල් සිද්ද වෙන්න පුළුවන්, මොන දේ සිද්ද වුණත් ඔයා ගත කරන මොහොත සතුටින් ගත කරන්න, මොකද ජීවිතය කියන්නේ තණ ගසක රැඳුණ පිනි බිංදුවක් වගේ, ඊළඟ මොහොතේ මොනවා වෙයිද කියලා අපි කවුරුවත් දන්නේ නැහැ... කියලා"

හේමා දෙතොල් අගින් සියුම් සිනහවක් මතු කොට, ඇය අත වූ කොන්යැක් වීදුරුව ඉහළට එසවූවාය.

"ඒනිසා මිත්‍රවරුනි, මේ ලැබිලා තියෙන මොහොතේ අපි ප්‍රීති වෙමු. සතුට බෙදාගමු. හොඳින් ජීවත් වෙමු. මොකද ඊළඟ මොහොතේ කුමක් වේවිද දන්නේ නැහැ. මේක අපේ ජීවිතේ සතුට වෙනුවෙන්"

එසේ කී ඇය වීදුරුව මේසය වටා සිටියවුන් වෙත දිගු කළාය. ඔවුණුත් ඇයව අනුගමනය කරමින්,

"ජීවිතේ සතුට වෙනුවෙන්" යැයි පවසමින් තම වීදුරුව එකිනෙකාගේ වීදුරුවල හප්පා එකම උගුරකින් එය හිස් කර දැමුවෝය.

එය නිවසේ සිටි සියල්ලන්ම මෙතෙක් බලාපොරොත්තුව සිටි රාත්‍රී භෝජන සංග්‍රහයේ ආරම්භ විය.

වේලාව රාත්‍රී 9 යි

කෑම ගන්නා අතරතුරදී කොන්යැක් බෝතලය හිස් කරමින් කට්ටිය විවිධාකාර දේ කතා කළෝය. ඒ අතරින් කියාරා එතැනට පැමිණ සිටි පිරිස හේමාට හමුවූ ආකාරය ගැන විස්තරයක් කරන ලෙස ඉල්ලා සිටියෙන්, හේමා ඔවුන්ගේ මුල්ම හමුවීම ගැන විස්තර කරන්නට පටන් ගත්තාය.

"හරි, මම එහෙනම් කියාරාගෙන්ම පටන් ගන්නම්" හේමා සිනහවකුත් සමග කියාරා දෙස බැලුවාය.

"කියාරාව මට හමුවුණේ එයාලගේ රෙස්ටුරන්ට් එකේදීමයි"

කියාරා ඇයගේ අදහස අනුමත කරන්නට මෙන් හිස සලමින්"ලූනා කැෆෙ" එකේදී යැයි කීවාය.

"ඔව්, ලූනා කැෆෙ එකේදි, අපි දැන් ඉන්නේ අලෙක් මනුක්යාන් වීදියේ, මේකට එහා පැත්තේ කිලෝමීටරයක් විතර දුරකින් තියෙනවා සයත් නෝවා වීදිය. ඇන්තෝනියෝගේ රෙස්ටුරන්ට් එක තියෙන්නේ සයත් නෝවාවල. මම හවස වැඩ හැරිලා එන්නේ ඒ පැත්තෙන් ඉතින් සමහර වෙලාවට රෑ කෑම ගන්නේ ලූනා කැෆෙ එකෙන්. ඉතින් කියාරා, ඇන්තෝනියෝ සහා ලූනා කැෆෙ, ඒක තමයි අපේ ඉතිහාසය" කී හේමා කියාරා දෙස යළිත් බලා, ඇස් පුංචි කර කල්පනාවක නිමග්න විය. එම කල්පනාවෙන් ඇය බලාපොරොත්තු වූ පිළිතුර නොලැබුණෙන් මෙසේ ඇසුවාය.

"අපේ ආශ්‍රය පටන් අරගෙන දැන් අවුරුද්දකටත් කිට්ටුයි, නේද කියාරා?"

"ඔව්, බබා ලැබෙන්නත් කලින්" කියාරා පිළිතුරු දුන්නාය.

එයත් සමගම ඇන්තෝනියෝ ඔහුගේ ඉදිරියේ තිබුණු කොන්යැක් වීදුරුව අතට ගෙන නැගිට්ටේය. බොහෝමයක් ඉතාලි ජාතිකයින්ට උපතින්ම ඇත්තේ උස් සිරුරකි. ඇන්තෝනියෝත් අඩි හයකටත් වඩා උස කෙනෙකි. ඔහු කොණ්ඩය මුදුනට වෙන්නට පීරා ඇත. රැවුල මුළුමනින්ම කපා ඇති නිසාවෙන් ඔහුගේ මුහුණ ග්‍රීක දෙවි හර්මෙස්ගේ මුහුණ මෙන් ආලෝකමත් වී ඇත. කොන්යැක් වීදුරුව අතෙහි තබාගෙන හේමා දෙස ගැඹුරු

බැල්මක් හෙළූ ඔහු,

"මේක හේමා වෙනුවෙන්... හේමා බොහෝම ස්තුතියි මේ සාදය වෙනුවෙන් මටයි කියාරටයි ආරාධනා කළාට" යැයි පවසා, එය හේමාටත් අනිත් අයටත් දිගු කළේය.

හේමා කොන්යැක් වීදුරුව ගෙන මේසයෙන් නැගී සිට, ඇන්තෝනියෝ දෙස කෘතඥව බලා මෙසේ කීවාය.

"ඔයාලා හැමෝම මගේ හොඳම යහළුවන්. සමහරවිට මට ඉන්න එකම යහළුවනුත් ඔයාලම විතරයි. ඉතින් අද මගේ ගෙදරට ආව එක ගැන මමයි ඔයාලා සියල්ලන්ටම ස්තුති කරන්න ඕනේ" සියල්ලෝම එම වචනවලින් ප්‍රීතියට පත් වූවෝය. ඔවුන් එකිනෙකා හේමාට යලි යළිත් ස්තුති කරමින් වීදුරු එකිනෙක හප්පා කොන්යැක් පානය කළෝය.

වීදුරු හිස් වූ පසු යළිත් කොන්යැක් බෝතලය අතට ගත් ටාබෝ හිස් වූ වීදුරු පුරවමින් විත් හේමාගේ විදුරුව වෙතට බෝතලය දිගු කළේය. ඇයගේ වීදුරුව හිස් වී නොමැත. ඔහු හේමා දෙස ආරූඪ කරගත් වික්ෂිප්ත බැල්මක් හෙළීය.

"හේමා, අපිට පොවලා ඔයාට නොබී ඉන්න බැහැ"

"නෑ එහෙම එකක් නැහැ" හේමා සිනහසෙමින් තොල් මැතිරුවාය.

"කපටි කෙල්ල, ඒයි මේ, මෙයා හදන්නේ අපිට පොවලා මගහරින්න" කී ටාබෝ හේමාගේ බාගයක් හිස්ව තිබුණු කුඩා වීදුරුව මුළුමනින්ම කොන්යැක්වලින් පිරෙව්වේය. හේමා කිසිවක් කීවේ නැත. ඒ වෙනුවට ටාබෝ දෙස බලා ඇස් පුංචි කර සිනාසුණු ඈ"හරි, මම දැන් ටාබෝව මුණගැසුණ විදිය කියන්න යන්නේ" යැයි පැවසූවෙන් එයින් ටාබෝ සැනසීමට පත් වූ බැව් පෙනිණ. ඔහු අතේ තිබුණු බෝතලය මේසයෙන් තබා හරිබරි ගැහී පුටුවේ හොඳින් ඉඳගෙන හේමා දෙස අයා ගත් දෙනෙතින් බලා සිටියේය.

"ටාබෝව මට මුන ගැහුණේ..." හේමා කල්පනා කළාය. ටික මොහොතක් කල්පනා කළ ඈ"මට මතක නැහැනේ" යැයි කීවෙන් මේසය වටා සිටි සියල්ලෝම හිනා වන්නට වූවෝය.

හේමාගේ විහිළුවෙන්, මෙතෙක් බැරෑරුම් මුහුණක්

මවාගෙන ඇයගේ මුවින්ම ඔවුන් හමුවූ ආකාරය අසන්නට බලාපොරොත්තුවෙන් සිටි ටාබෝගේ මුහුණ මැලවී ගියේය. ඔහු කනගාටුවෙන් මෙන් හේමා දෙස බලා"ජූනි පස්වෙනිදා" යැයි පැවසුවේය.

ඔහු දිනය කියත්ම සොෆී, "ආන්න නියම පිරිමි, එඩ්ගාර්ටනම් අපිව හමු වුණ මුල්ම දවස මතකවත් නැතිව ඇති" යැයි කීවෙන් , සොෆී දෙස බැලූ එඩ්ගාර් ඔහුගේ හිසට අතක් තබා කල්පනාවක් මුහුණට ආරූඪ කොට ගෙන"මතක නැහැ නේන්නම්" යැයි පැවසුවෙන් මේසයේ සිටි සියල්ලෝම යළිත් සිනාසුණෝය.

"හරි මට දැන් මතක් වුණා" සිනහ හඬ යටපත් කරමින් හේමා පැවසුවාය.

"ටාබෝව මට මුලින්ම මුණ ගැහුණේ ජර්මුක්වල තියෙන හෝටලයකදී, ඒ හෝටලය තියෙන්නේ අර්තසාක් වැව ළඟ. ටාබෝගේ නිවස තියෙන්නෙත් ඔය වැවට කිට්ටුවමයි. මම කවදාවත් ජර්මුක් වලට ගිහින් නැති නිසා දවසක් ගියා ඒ පැත්තට සවාරියක්. ඔන්න ඕකෙදි තමයි මට ටාබෝව මුණ ගැහෙන්නේ" කී හේමා කතාව නැවැත්තුවාය.

එහෙත් ටාබෝ ඇය දෙස තවත් බලා සිටියෙන් ඔහු දෙස ලැජ්ජාවෙන් මෙන් බැලූ හේමා,

"ඇයි?" යනුවෙන් ඉඟි කළෙන් ටාබෝ මෙසේ කීවේය.

"එතකොට ඉතිරි ටික?"

"මොන ඉතිරි ටිකද?"

"ඔයාව අර්තසාක්වල ගිලෙන්න යද්දි මම බේරගත්තු හැටි?"

"ඒ මොකක්ද ඒ?" ටාබෝගේ කතාවෙන් ඇතිවූ කුතුහලයෙන් එඩ්ගාර් කෑගැසීය.

"ඔව් ඒක ඇත්ත, මම අර්තසාක් වැවේ පීනද්දී මාව ගිලෙන්න ගියා. ටාබෝ තමයි මාව ඇවිත් බේරගත්තේ"

"මෙයා මෙහෙම සැහැල්ලුවට කිව්වට, ඇත්තටම එදා මම නැත්නම් අද හේමත් නැහැ"

"ඔව් ඔව්, ඒකනම් ඇත්ත. ඒක මම පිළිගන්නවා" හේමා

ටාබෝගේ කතාව සනාථ කරමින් හිස සැලුවාය.

"ස්තුතියි ඔයාට මාව බේරගත්තට" තම පුටුවට හරි කෙලින් මේසයේ කොනේ ඉඳගෙන සිටි ටාබෝ දෙස බලා, හේමා මිමුණුවාය. ටාබෝ ඒ ඇසිල්ලෙන්ම හේමා වෙතට විත් ඇයගේ කම්මුලට හාද්දක් දුන්නේය.

"ඕන වෙලාවක මම ඔයාව බේරගන්න ලෑස්තියි කෙල්ලේ" ඔහු ආදරයෙන් පිනා ගිය මුහුණකින් යුක්තව පැවසුවේය.

ටාබෝගේ ආදර රැගුම් සාදය පටන් ගත් මොහොතේ පටන් කිහිපවරක්ම අමුත්තන් දුටුවෙන්, තමා ඉදිරියේ තිබුණු වීදුරුවක් අතට ගත් සොෆී එයට හැන්දෙන් සෙමෙන් තට්ටු කරමින් මෙසේ පැවසුවාය.

"හරි, දැන් ටාබෝගේ අවස්ථාව ඉවරයි. දැන් ඔයා ඇවිත් ඉඳගන්න ඕනේ" ඇය එසේ කියත්ම හේමාගෙන් මිදී ඔහුගේ ආසනය වෙත පැමිණි ටාබෝ කොන්ද නමා ඔහුගේ සුපුරුදු නාට්‍යානුකූල ආකාරයට"හොඳයි සොෆී මහත්මිය" කියමින් ආසනයේ ඉඳගත්තේය.

"දැන් අපි දෙන්නා" සොෆී කීවාය.

"හරි, සොෆී සහ එඩ්ගාර්" හේමා ඔවුන් දෙපළ දෙසට ඇඟිල්ල දිගු කර මෙසේ කීවාය.

"මේ දෙන්නවනම් මට මුණ ගැහෙන්නේ අනතුරකින්"

"අනතුරකින්?" කියාරා විමතියෙන් ඇසුවාය.

"ඔව් අනතුරකින්, දවසක් වාග්නීවලදී මගේ කාර් එක තවත් කාර් එකක හැප්පෙනවා. ඒ කාලේ මෙයාලට තිබුණේ

"රුසියානු ලාඩා එකක්. මීට මාස ගාණකට විතර කලින්. ඒ හැප්පිච්ච කාර් එකේ හිටියේ මේ දෙන්නා. හැබැයි ඒක සම්පූර්ණයෙන්ම මගේ වැරැද්ද. කොහොම හරි, ඒ අනතුරින් තමයි අපි තුන්දෙනා මුණ ගැහෙන්නේ"

"හැබැයි ඒ අනතුර නිසා හේමාට ඩ්‍රාම් පනස්දාහක් විතර ගෙවන්නත් වුණා" සොෆී කීවාය.

"ඔව්, එහෙත් අපි ඒකෙන් යහළුවෝ වුණානේ" හේමා සිනාමුසු මුහුණින් පැවසුවාය.

"හරිනේ, දැන් හැමෝම දන්නවා අපේ ඉතිහාසය ගැන" කී එඩ්ගාර් කොන්යැක් වීදුරුවත් ගෙන මේසයෙන් නැගී සිටියේය.

"මේක අපි හැමෝගෙම හමුවීමට. මම අහලා තියෙනවා මිනිස්සු හමුවෙන්නේ මොකක් හරි හේතුවක් නිසා කියලා. ඒ වගේම ඒ හමුවීමෙන් ජීවිතයට හොඳක් හෝ නරකක් වෙනවා කියලා... මම ප්‍රාර්ථනා කරනවා අපේ හමුවීමෙන් හොඳක් මිස නරකක් වෙන්න එපා කියලා" කී ඔහු කොන්යැක් වීදුරුව හැමෝම වෙත දිගු කළේය. ඔවුනොවුන් එකිනෙකාගේ වීදුරු එකට හප්පා,"අපේ හමුවීමට" යැයි කීවෝය.

එක් අයෙක් යමක් කී පසු, තවත් කෙනෙකුට එයට එකතු කිරීමට යමක් ඇත්නම් එය එකතු කිරීමත් කොන්යැක් පානයේ චාරිත්‍රයේම කොටසකි. හේමා වීදුරුව අතේ තබාගෙන එයට තවත් යමක් එකතු කළාය.

"එදා වෙන වෙනම හමුවුණු අය සේරම අද එකට හමුවෙලා තියෙනවා. එඩ්ගාර් කිව්වා වගේ මේ හමුවීමෙන් හොඳක් මිස නරකක් වෙන්න එපා කියලා මම ප්‍රාර්ථනා කරනවා"

මේ මොහොතෙදි සොෆි ඇයගේ පුටුවෙන් නැගි සිටියාය.

"අද ඉඳන් අපි හැමෝම මිත්‍රයෝ" කී ඇය වීදුරුව මේසය වටා සිටි හැමෝටම දිගු කළාය,

"ටාබෝ, කියාරා, ඇන්තෝනියෝ, හේමා, මේක අලුත් යහළුවන්ගේ හමුවීම වෙනුවෙන්"

ඒත් සමගම මේසය වටා සිටි හැමෝම මේසයෙන් නැගිට වීදුරු සියල්ල යළිත් වතාවක් එකිනෙක හප්පා"අපි හැමෝගෙම හමුවීමට" යැයි පවසා එය පානය කළෝය.

වේලාව රාත්‍රී 9.30 යි

භෝජන සංග්‍රහය ආරම්භ වී පැයක පමණ කාලයක් තුළ මේසය

වටා සිටි සියල්ලෝම එකතුව, කොන්යැක් බෝතලය මුළුමනින්ම පාහේ අවසන් කර හොඳහැටි පදම් වී සිටියෝය. හේමා මත්පැන් පානය කළේ වීදුරුවකටත් අඩුවෙනි. ඒ වීදුරුවත් ටාබෝ ඇය ඔවුන්ව රැවටීමට යත්න දරනවා යැයි කීමෙන් පසුවය. එහෙත් ඇය එයින් පසුව යළිත් පෙර නාටකයේම රැඳී සිටීමට සමත් විය. මත්පැන් පානය කරන විට මෙන් වීදුරුව තොල අසලට ගෙන යළිත් මේසය මත තැබූ ඈ, සියල්ලන්ගේම මනස කිසිවෙකුගේ හෝ කතාවකට ඇදී ගොස් ඇති මොහොතක වීදුරුවේ තිබුණු කොන්යැක් එතැන වූ සිසිල් බීම වීදුරුවකට හිස් කළාය. එය ඉතාමත් සූක්ෂමව කිරීමට ඈ වග බලාගත්තාය.

අර්මේනියානු කාන්තාවන් රුසියානුවන් මෙන්ම මත්පැන් පානයට ප්‍රිය කළෝය. සමහරු සිගරට් ඉරීමටත් පුරුදු වී සිටි අතර විශේෂයෙන්ම හතළිහ ඉක්මවූ කාන්තාවන් එය වයසේ වැරැද්ද යැයි සලකා එයට ඇබ්බැයි වීම ගැන මැසිවිලි දෙඩුවෝය. සොෆියාද එවන් අයෙකි. හතළිහ නොඉක්මවූවත් සොෆියා බොහෝ කලෙක සිටම සිගරට් ඉරීමට පුරුදුවී සිටි කෙනෙකි. එඩ්ගාර් සිගරට් පැකට්ටුව එළියට ගනිද්දි ඇයත් ඇයගේ බෑගයෙන් පැකට්ටුවක් එළියට ගත්තාය. ඒවා අතට ගෙන ඔවුන් දෙදෙනාම පුටුවෙන් නැගිට්ටේ නිවසින් පිටතට යෑමටය. එහෙත් හේමා ඔවුන්ව නවත්වා ගත්තාය.

"එළියට යන්න ඕනේ නැහැ. ඕක මෙතන ඉඳන්ම බොන්න. හැබැයි සාදය තවම ඉවර නැහැ, ඕක බිව්වට කමක් නැහැ තව කෑම කන්නත් ඕනේ"

"ඔයාලට ප්‍රශ්නයක් නැද්ද?" එඩ්ගාර් මේසය වටා සිටි අනිත් අයගෙන් කාරුණිකව ඇසුවේය.

"මට ප්‍රශ්නයක් තියෙනවා" ටාබෝ එක්වරම ඉදිරියට පැන්නේය. ඉදිරියට පැන ඔහුගේ කෝට් සාක්කුවෙන් කුඩා ඇලුමිනියම් පෙට්ටියක් එළියට ගත් ඔහු,

"ඕවා වැඩක් නැහැ, මේකෙන් එකක් උරලා බලන්න" යැයි පවසමින් එය විවර කොට ඔවුන් ඉදිරියේ තැබීය. එහි වූයේ 'සිග ා' වර්ගයේ තනි දුම් කොළයෙන් සාදන ලද, තරමක ලොකු

ප්‍රමාණයකින් යුත් සිගරට් කිහිපයකි. එයින් එකක් අතට ගත් එඩ්ගාර් එය අත්ල මත තබා කරකවා බැලීය.

"අතින් හදාපුවා වගේ"

"ඔව්, තනිකරම මගේ අතින්. කඩේ වගේ බාල බඩු නෙමෙයි. හොඳ ඒවා" කී ඔහු ඇලුමිනියම් පෙට්ටිය සොෆියාට දිගු කළේය.

එඩ්ගාර් දෙස බැලූ සොෆියා ඔහුගෙන් ලද ඉඟියකින් පසු එයින් එකක් අතට ගත්තාය.

ඊළඟට ටාබෝ ඇන්තෝනියෝ සහ කියාරා දෙස බැලුවේය.

හඬ බාල කොට,"ඕනෙදැයි" ඇසුවත් ඔවුන් එය ප්‍රතික්ෂේප කළෙන්,

"මේවා කොහොමත් ඉතාලියේ අයට හරියන්නේ නැහැ" යැයි පවසමින් කට කොනකින් සිනාසෙමින් සිගරට් පෙට්ටිය යළිත් කොට් සාක්කුවෙහි බහා ගත්තේය.

ඔහුගේ මේ අසික්කිත විහිළුව නිසා කියාරාගේ මුහුණ මැලවී ගියාය. ඇන්තෝනියෝ නම් එය ගණන් ගත් ආකාරයක් පෙනෙන්නට නොතිබිණ.

"අපි යමු එළියට, මේක ඔය නිකන් සිගරට් වගේ නෙමේ සැර වැඩියි. මේකේ දුමට හේමට කලන්තේ දාන්නත් පුළුවන්" හේමා දෙස බලා සිනාසුණු ටාබෝ වෙරි මතින් වැනෙමින් අනිත් දෙදෙනාවත් ඇදගෙන සිගරට්ටුව උරන්නට එළියට ගියේය.

නිවසේ දොර අසල එළිපත්තෙහි හිටගත් ඔවුන් සීතලේ ගැහෙමින්, තම කබා තවත් ඇඟට තද කර ගනිමින් සිගරට්ටු උරන්නට පටන් ගත්තෝය. එහෙත් සමගම නිවස ඇතුළේ කෑම මේසයේ ඉඳ සිටි කියාරා හේමා අසලට නැමී,

"ටාබෝ ඔයාගේ පෙම්වතාද?" යි ඇසුවාය.

හේමා එයට සිනාසුණාය.

"එයානම් එහෙම තමයි හිතාගෙන ඉන්නේ, එහෙත් මගේ හිතේ එහෙම එකක් නැහැ"

"එහෙනම් ඔයා ඒක එයාට කියන්න, මොකද මිනිහා

හැසිරෙන්නේ හරියට ඔයාව එයා අයිති කරගෙන වගේ"

"ම්ම්..." හේමා සුසුමක් හෙළුවාය.

"ඒ වගේම පරිස්සමෙන් හේමා" කියාරා යළිත් මිමිනුවාය."මටනම් ඔය මනුස්සයව වැඩිය අල්ලන්නේ නැහැ. කිසිම හැදිච්ච කමක් නැති ගොඩයෙක් වගේ"

කියාරා එසේ කියා අවසන් වෙත්ම ආහාර ගන්නා ගමන්ම ඇන්තෝනියෝ මෙසේ පැවසුවේය.

"කොහොමත් යෙරෙවාන්වල නෙමේනේ"

ඇයගේ මුවින් එය පිට වූයේ ඇනුම් පදයක ආකාරයෙනි. යෙරෙවාන්වල මිනිසුන් ගම්වල මිනිසුන් සමග වැඩිය ඇහි හොඳැයියක් තියා ගැනීමට කැමති වූයේ නැත. කියාරා සහ ඇන්තෝනියෝ ඉතාලි ජාතිකයින් වුවත් යෙරෙවාන්වල ජීවත් වූ නිසා, යෙරෙවානයෙන් පිට ජීවත් වන්නවුන් ගැමියන්ය යන මතයේ ඔවුන්ද ඇලී සිටියෝය.

හේමා එයට කිසිවක් කීවේ නැත. යෙරෙවානයෙන් පිටත ජීවත් වන හැමෝම ටාබෝ මෙන් අසික්කිත, සදාචාරයක් නැති අයවලුන් නොවන බව හේමා හොඳාකාරවම දැන සිටියාය.

එහෙත් ටාබෝ ගැන නම් එයට හාත්පසින්ම වෙනස්ය. ඔහු නිසා සාදයට පැමිණි අය අතර දැනටමත් සිත් තැවුලක් ඇතිවී ඇත. මෙය ඒ තරම් හොඳ පෙරනිමිත්තක් නොවන බව හේමාට වැටහුණාය. ඇන්තෝනියෝ නිශ්ශබ්ද පුද්ගලයෙකි. ඔහු මුවින් නිකරුණේ වචන පිට කරන්නෙකු නොවේ. එහෙයින් ඔහුගේ මුවින් ටාබෝ ගැන පිටවූ වචනය ඇනුම්පදයකටත් වඩා ළඟම එන අනතුරක් ගැන ඉඟියක් හේමා තුළ ඇති කළාය.

වේලාව රාත්‍රී 10 යි

ටික වේලාවකින්ම, සිගරට්ටු ඉරීමට එළියට ගිය අය ඔවුන්ගේ කබාවල තිබුණු හිම පියලි ගසමින් නිවස ඇතුළට විත් දොර වසා

දැමුවෝය. කබා දොර අසල වූ කොක්කෙහි එල්ලූ ඔවුහු සීතලේ ගැහෙමින් විත් යළිත් කෑම මේසයේ ඉඳගත්තෝය.

ටාබෝ හේමා දෙස බැලුවේය. හේමාගේ මුහුණ වෙනස් වී ඇත. ඔහුගේ දෑස කියාරා සහ ඇන්තෝනියෝ දෙසට යොමු විය. ඉන්පසුව පුටුවල ඉඳගත් එඩ්ගාර් සහ සොෆියා දෙසට හැරුණු ඔහු,

"අපි එළියට ගිය ටිකට මෙතන මොකක් හරි වෙලා තියෙනවා වගේ" යැයි පැවසුවෙන් එයින් හේමාගේ මුහුණ තවත් අඳුරු වූ බැව් කිව යුතුය.

ඔහු එය කීවේ ඇන්තෝනියෝ සහ කියාරාට බැව් ඇය දත්තාය. කුමක් හෝ හේතුවක් නිසා ඔවුන් දෙදෙනා නිවසට ආ මොහොතේ පටන් ටාබෝගේ සිතෙහි තිබුණේ නෝක්කාඩුවකි.

සමහර විට එය ටාබෝගේ පුරුද්ද විය හැක. බීමත් වූ පසුව සමහරුන්ගේ ජන්ම ගති ඉස්මතු වෙයි. සමහරු ගහ බැන ගැනීමටත්, අනෙකාව පරයා වීරයන් වීමටත් තැත් කරති. තවත් සමහරු ජීවිතයේ කවරදාවත් නැති ලෙස කාරුණික තැන්පත් ස්වභාවයට පත් වෙති. මෙයින් ටාබෝ රඟන්නේ මෝඩ තකතීරු චරිතයක් බැව් සිතූ හේමා යටි සිතෙන් ඔහුට ශාප කරන්නට පටන් ගත්තාය. ඇය ටාබෝ දෙස තදින් බලා ඉඳගන්නැයි ඉඟි කළෙන්, ඇගේ අඳුරු වී ගිය මුහුණින්ම ඇය තමන් සමග අමනාප වී සිටින බැව් වටහා ගත් ටාබෝ තවත් කිසිත් නොකියා ඉඳගත්තේය.

ටාබෝ ඉඳගනිද්දි කියාරා ඇයගේ ඉදිරියේ තිබුණු මස් බන්දේසියේ වූ මස් කැබැල්ලකට ගෑරුප්පුවෙන් ඇන්නාය. ඇය එසේ කළේ එය තම පිඟානට දමා ගැනීමට වුවත්, සිතේ තිබුණු කෝපය නිසාවෙන් ගෑරප්පුව සැරෙන් මස් කැබැල්ලේ පැත්තකට වැදී, එය පිඟානෙන් ඉවතට විසිවී ගොස් ඇය අසල ඉඳ සිටි ඇන්තෝනියෝගේ ඇඟේ වැදී බිම වැටිණ. ඇන්තෝනියෝ කෝපයෙන් නැගිට්ටේය.

"මොන මඟුලක්ද කරන්නේ?"

මස් කැබැල්ල වැදීම නිසා ඇඳ සිටි සුදු කමිසයේ ඇතිවූ